## මාර්ග ගැසට් කිරීමේ ක්‍රියාවලිය

මාර්ග ගැසට් කිරීම සඳහා යෝජනාව ඉදිරිපත් කිරීම

↓

මැනීමට අදාළ කාලය දීර්ඝ කිරීම සඳහා සභා තීරණය සමඟ විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කිරීම

↓

යෝජිත මාර්ග ලයිස්තුව තාක්ෂණික නිර්දේශය සඳහා තාක්ෂණ නිලධාරියා වෙත යොමු කිරීම

↓

මැනීම නිර්දේශ කළ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කිරීම

↓

මැනීමට අනුමැතිය ගැනීම සහ මිනුම් කර මාර්ග මායිම් පැහැදිලිව සඳහන් කරමින් පිටපත් 05 බැගින් සිතියම් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කිරීම

↓

මාර්ග දෙපස පදිංචි කරුවන්ගේ නම් සහිතව මාර්ග මායිම් පැහැදිලිව සඳහන් කරමින් පිටපත් 05 බැගින් සිතියම් ලබාගැනීම. මාර්ග මායිම් නොමැතිවිට මායිම් වල ස්ථිර සලකුණු යෙදීම

↓

සිතියම් සහිත මායිම් උපලේඛනයක් සමඟ මාර්ග ලේඛනයක් පිළියෙල කර මහා සභා අනුමැතියට යොමු කිරීම

↓

මහ සභා අනුමැතිය සමඟ විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කිරීම

↓

විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබුණු පසු විරෝධතා ඉදිරිපත් කිරීමට මාස 03ක කාලයක් වෙන් කරමින් සිතියම් සමඟ මායිම් උපලේඛනය සමඟ මාර්ග ලේඛනයක් ගැසට් පත්‍රයේ පළ කිරීම

↓

- මාස 03ක කාලයට පසු විරෝධතා නොමැති විට, මාස 06ක් ඉක්ම යාමට පෙර නැවත නියමිත ආකාරයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම
- මාස 03ක කාලයට පසු විරෝධතා ඇති විට, විරෝධතා පරීක්ෂණයක් පැවත්වීම (ඉඩමක කොටසක් හරහා මාර්ගය ලකුණු කර ඇති විට නියම කරන ලද කාලය තුළ ඉඩමට තමන්ගේ අයිතිය ඔප්පු කිරීමට නිසි අධිකරණයෙහි නඩුවක් පැවරවීම)
  - විරෝධතා වලට, මාස 06 ක කාල සීමාව ඉක්ම යාමට පෙර අවසාන තීරණයක් ලැබුණු විට අදාළ පරිදි සැලසුමෙහි අදාළ වෙනස් කිරීම් කර, නියමිත ආකාරයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම
  - විරෝධතා වලට මාස 06 ක කාල සීමාව ඉක්ම යාමට පෙර අවසාන තීරණයක් නොලැබෙන විට, ප්‍රශ්නගත මාර්ග හෝ මාර්ග කොටස් අත හැර සැලසුමෙහි අදාළ වෙනස් කිරීම් කර නියමිත ආකාරයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම
    - ↓ දැන්වීම පළ කිරීමෙන් පසු අවසාන තීරණය ලැබුණු පසු එම මාර්ග හෝ මාර්ග කොටස් ඇතුළත් කර අතිරේක නාම ලේඛනයක් ගැසට් පත්‍රයේ පළ කිරීම

## 08.1 හැඳින්වීම

වෙනත් යම් අධිකාරියකට නීතියෙන් පවරන ලද බලතල සහ වගකීම්වලට යටත්ව, පළාත් පාලන ආයතනයෙහි බල ප්‍රදේශය තුළ පිහිටි සියලු මංමාවත් වලින් හෝ විවෘත භූමිභාග වලින් හෝ ඒවා සම්බන්ධයෙන් හෝ උද්ගත වන සියලු පොදු අයිතිවාසිකම්, සම්බන්ධතා සහ පහසුකම් ආරක්ෂා කිරීම සහ නඩත්තු කිරීම සඳහා ද එම මංමාවත් හෝ විවෘත භූමිභාග පොදු කාර්යන් සඳහා උපයෝගී කර ගැනීම විධිමත් කිරිම, සකස් කර ගැනිම සහ සංවර්ධනය කිරිම සඳහා ද අවශ්‍ය සියලු පියවරවල් ගැනීම සෑම පළාත් පාලන ආයතනයකම කාර්යය විය යුතු අතර, එසේ පියවර ගැනීමට එම පළාත් පාලන ආයතනවලට බලය පවරනු ලැබ ඇත.

## 08.2 නෛතික අධිකාරිය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය.

(ආ) කලින් කලට නිකුත් කර ඇති අදාළ වන සංශෝධන, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා, නියෝග, සහ උපදෙස්.

## 08.3 සුදුසුකම්

වෙනත් යම් අධිකාරියකට නීතියෙන් පවරන ලද බලතල සහ වගකීම්වලට යටත්ව, පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුලත පිහිටා ඇති ප්‍රධාන මංමාවත් නොවන සියලු මංමාවත් සහ මාර්ග මේ සඳහා සුදුසුකම් ලබයි.

## 08.4 ගාස්තුව

මේ සඳහා ගාස්තුවක් අය නොකළ යුතුය.

## 08.5 ඉදිරිපත් කළ යුතු ලේඛන

මාර්ග ගැසට් කිරීම සඳහා, මාර්ග විස්තර ඇතුළත් කර සකස් කරන ලද යෝජනාවක් ඉදිරිපත් කළ යුතුය.

## 08.6 කාර්යය පටිපාටිය

| පටිපාටිය | කාල සීමාව | වගකීම |
|---|---|---|
| මාර්ග ගැසට් කිරීම සඳහා යෝජනාව ඉදිරිපත් කිරීම. | | |
| මැනීමට අදාළ කාලය දීර්ඝ කිරීම සඳහා මහ සභා තීරණය සමහ විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කිරිම. | කඩිනමින් | විෂය භාර නිලධාරි / ලේකම් / සභාපති |

| පටිපාටිය | කාල සීමාව | වගකීම |
|---|---|---|
| යෝජනාව තාක්ෂණ නිලධාරියා වෙත යොමු කිරීම. | යෝජනාව ඉදිරිපත් කරනු ලබන දින සිට දින 07 ක් ඇතුළත. | විෂය භාර නිලධාරි / ලේකම් |
| එම යෝජනාවට අදාළව මාර්ග අංක, මාර්ගවල නම්, දිග, පළල, ආරම්භක ස්ථාන, අවසාන ස්ථාන යනාදී තොරතුරු ඇතුළත්ව, මිනින්දෝරු මගින් මැනීමට නිර්දේශ කරන ලද සවිස්තර වාර්ථාවක් ඉදිරිපත් කිරීම. | දින 14 යි. | තාක්ෂණික නිලධාරි/ වැඩ අධිකාරි |
| මැනීමට අනුමැතිය ගැනීම සහ මිනුම් කර මාර්ග මායිම් පැහැදිලිව සඳහන් කරමින් පිටපත් 05 බැගින් සිතියම් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කිරීම. | දින 21ක් ඇතුළත. | විෂය භාර නිලධාරි/ ලේකම්/ සභාපති |
| යෝජිත මාර්ග මැනීම. මාර්ග දෙපස පදිංචිකරුවන්ගේ නම් සහිතව මාර්ග මායිම් පැහැදිලිව සඳහන් කරමින් පිටපත් 05 බැගින් සිතියම් ලබාගැනීම. මාර්ග මායිම් නොමැතිවිට මායිම්වල ස්ථිර සලකුණු යෙදීම. | මැනීමට ඇති මාර්ග ප්‍රමාණය මත සාධාරණ කාලය ඇතුළත. | තාක්ෂණික නිලධාරි/ වැඩ අධිකාරි/ ලේකම්/ සභාපති |
| සිතියම් සහිත මායිම් උපලේඛනයක් සමඟ මාර්ග ලේඛනයක් පිළියෙල කර මහ සභා අනුමැතියට යොමු කිරීම. | ආසන්නම මහා සභා දිනය. | විෂය භාර නිලධාරි/ ලේකම්/ සභාපති |
| විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කිරීම. | මහා සභා අනුමැතිය ලැබුණු දින සිට දින 07 ඇතුළත. | විෂය භාර නිලධාරි/ ලේකම් |
| විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබුණු පසු විරෝධතා ඉදිරිපත් කිරීමට මාස 03ක කාලයක් වෙන් කරමින් සිතියම් සමඟ මාර්ග ලේඛනයක් ගැසට් පත්‍රයේ පළ කිරීම. | විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට දින 14ක් ඇතුළත. | විෂය භාර නිලධාරි/ ලේකම්/ සභාපති |
| මාස 03ක කාලයට පසු විරෝධතා නොමැති නම්, මාස 06ක් ඉක්ම යාමට පෙර නැවත විරෝධතා නොමැති බවට නියමිත ආකාරයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම. | පළමු ගැසට් පත්‍රයේ පළ වුණු දින සිට මාස 03ක කාලයට පසු මාස 06ක කාලයක් ඉක්ම යාමට පෙර | විෂය භාර නිලධාරි/ ලේකම්/ සභාපති |

| පටිපාටිය | කාල සීමාව | වගකීම |
|---|---|---|
| විරෝධතා ඇතිවිට විරෝධතා පරීක්ෂණයක් පැවත්වීම. විරෝධතා ලෙස මාස 03ක කාලය තුළ, යම් පාර්ශවයක ඉඩමක කොටසක් හරහා මාර්ගය ලකුණු කර ඇති විට, එම කාලය තුළ ඉඩමට තමන්ගේ අයිතිය ඔප්පු කිරීමට නිසි අධිකරණයෙහි නඩුවක් පැවරීමට යොමු කිරීම. | පළමු ගැසට් පත්‍රයේ පළ වුණු දින සිට මාස 03ක කාලයට පසු මාස 06ක කාලයක් ඉක්ම යාමට පෙර අධිකරණ කටයුතු සඳහා පළමු ගැසට් පත්‍රයේ පළ වුණු දින සිට මාස 03ක කාලය ඇතුළත. | විෂය භාර නිලධාරි/ ලේකම්/ සභාපති |
| විරෝධතා වලට, මාස 06 ක කාල සීමාව ඉක්ම යාමට පෙර අවසාන තීරණයක් ලැබුණු විට අදාළ පරිදි සැලසුමෙහි අදාළ වෙනස් කිරීම් කර, නියමිත ආකාරයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම. | පළමු ගැසට් පත්‍රයේ පළ වුණු දින සිට මාස 03ක කාලයට පසු මාස 06ක කාලයක් ඉක්ම යාමට පෙර | විෂය භාර නිලධාරි/ ලේකම්/ සභාපති |
| විරෝධතා වලට මාස 06 ක කාල සීමාව ඉක්ම යාමට පෙර අවසාන තීරණයක් නොලැබෙන විට, ප්‍රශ්නගත මාර්ග හෝ මාර්ග කොටස් අත හැර සැලසුමෙහි අදාළ වෙනස් කිරීම් කර නියමිත ආකාරයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම. | පළමු ගැසට් පත්‍රයේ පළ වුණු දින සිට මාස 03ක කාලයට පසු මාස 06ක කාලයක් ඉක්ම යාමට පෙර | විෂය භාර නිලධාරි/ ලේකම්/ සභාපති |
| දැන්වීම පළ කිරීමෙන් පසු අවසාන තීරණය ලැබුණු පසු එම මාර්ග හෝ මාර්ග කොටස් ඇතුළත් කර අතිරේක නාම ලේඛනයක් ගැසට් පත්‍රයේ පළ කිරීම. | අවසාන තීරණය ලැබුණු පසු දින 21ක් ඇතුළත. | විෂය භාර නිලධාරි/ ලේකම්/ සභාපති |